www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: අත් අඩංගුවට පත් වූ සසප සාමාජිකයා නිදහස් වීමෙන් පසුව ලෝක සමාජවාදී වෙබ් අඩවියට කතා කරයි

## Sri Lanka: Arrested SEP member speaks to the WSWS following his release

**නන්ද වික්‍රමසිංහ විසිනි**
**2008 ඔක්තෝබර් 1**

*සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) සාමාජික වේලුම්මයිලුම් කමල්දාසන් සහ ඔහුගේ මස්සිනා වන චන්ද්‍රලිංගම් ඉලන්චේලියන් බස් රථයකින් කොළඹ බලා ඒමට සූදානම්ව සිටිය දී සැප්තැම්බර් 15 දා මීගමුවේ දී ශ්‍රී ලංකා පොලීසිය විසින් අත් අඩංගුවට ගන්නා ලදි. සසප කමල්දාසන් දිගු කාලීන පක්ෂ සාමාජිකයකු බව සනාථ කිරීම ද නොතකා ඔවුහු සතියකට වැඩි කාලයක් තිස්සේ මීගමුව පොලීසියේ කූඩුවක් තුල රඳවා ගෙන සිටින ලදි.*

*ආන්ඩුවට හා එහි වර්ගවාදී යුද්ධයට පමනක් නොව දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට හා එහි ධනේශ්වර ජාතිකවාදී වැඩපිලිවෙලට ද සසප විරුද්ධත්වය දක්වන්නේ ය යන්න ඉතා ප්‍රසිද්ධ කරුනකි. පොලීසිය මේ දෙදෙනා වහාම නිදහස් කිරීම ප්‍රතික්ෂේප කිරීම වනාහි "ත්‍රස්තවාදයට" එරෙහි යුද්ධයේ කඩතුරාව යටතේ මොන යම් හෝ විරුද්ධත්වයක් පාගා දමනු වස් යොදා ගැනෙන වඩ වඩා ප්‍රජාතන්ත්‍ර විරෝධී විධික්‍රම පිලිබඳ තවත් ලකුනකි. සසප සහ ලෝක සමාජවාදී වෙබ් අඩවිය විසින් ගෙන යනු ලැබූ බලගතු උද්ඝෝෂනයකින් පසුව පොලීසිය අවසානයේ සැප්තැම්බර් 23 දා ඔවුන් දෙදෙනා නිදහස් කලහ.*

*ලෝක සමාජවාදී වෙබ් අඩවියට කතා කරමින්* කමල්දාසන් ඔහු අත් අඩංගුවට ගැනීම පිලිබඳ තතු පැහැදිලි කලේ යඃ "ආන්ඩුවේ නීතිවලට අනුව පවා අපේ අනන්‍යතාව ඔප්පු කරන්න ප්‍රමානවත් තරම් නෛතික ලියකියවිලි අප ලඟ තිබුනා. අපි පොලීසියේ ලියාපදිංචි කිරීම පිලිබඳ ලියකියවිලිවල පිටපත් (සිංහල බහුතරයක් සහිත ප්‍රදේශවල ජීවත් වන සෑම දෙමල වැසියෙක් ම ඔහුගේ හෝ ඇගේ පදිංචිය ආසන්නයේ ම පිහිටි පොලිස් ස්ථානයේ ලියාපදිංචි කල යුතු ය) වගේ ම අපේ ගමන් බලපත්‍රත් අපි ගාව තිබුනා. ඒ වුනත් ඔවුන් අපව අත් අඩංගුවට ගත්තා. අපව අත් අඩංගුවට ගැනීමට දේශපාලන හේතු තිබුනා.

"තථ්‍ය වසයෙන් ම, අපව අත් අඩංගුවට ගැනීම වැඩ කරන ජනතාවට එරෙහිව විශේෂයෙන් ම ශ්‍රී ලංකාවේ දෙමල ජනතාවට එරෙහිව ගෙන යන පොදු ප්‍රහාරයේ කොටසක්. සම්මුඛ සාකච්ඡාවක දී ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ (ජනාධිපති මහින්ද රාජපක්ෂගේ සොහොයුරා) මෙසේ කියා තිබුනාඃ "සියලු දෙමල ජනයා ත්‍රස්තවාදීන් නොවේ. නමුත් ත්‍රස්තවාදින්ගෙන් සියයට 98ක්ම දෙමල අය." මෑත දී කොලඹට පැමින ඇති සියලු ම දෙමල ජනයා ආපසු යාපනයට යන එක ඔහුට අවශ්‍ය වුනා. ඔහු දෙමල ජනයා අත් අඩංගුවට ගැනීමට පොලීසියට පූර්න නිදහස දුන්නා.

"සැප්තැම්බර් 15 දා උදේ වරුවේ 11.30ට පමන අපි මීගමුව ප්‍රධාන බස් නැවතුම්පලෙන් බස් එකකට ගොඩ උනා. බස් එක හැතැප්ම කාලක් විතර ආවහම දුම්රිය හරස් පාර ගාවදි පොලීසිය ඒක නතර කලා. ඔවුන් අපට බහින්න කියලා අපේ ලියකියවිලි පරීක්ෂා කරලා, අපිව ඔවුන්ගෙ වෑන් එකට දා ගත්තා. අත් අඩංගුවට ගත්ත තවත් දෙන්නෙක් ඒ වෙන කොටත් වෑන් එකේ හිටියා.

"අපට ඇහුනා පොලිස් නිලධාරින් දෙන්නෙක් එකිනෙකාට මෙහෙම කියනවාඃ "මේක මදි බං. තව දෙන්නෙක් වත් අල්ලගන්න ඕන." අනෙක් දෙන්නගෙන් එක්කෙනක් ගම්පොල දෙමල තරුනයෙක්. ඔහු අවුරුදු තුනක් තිස්සෙ මීගමුවේ ජීවත් වෙනවා. අනෙක් එක්කෙනා උතුරු පලාතෙ. ඔහු අවුරුදු දෙකක් තිස්සෙ මීගමුවේ ජීවත් වෙනවා. සිංහල තරුනයෙකුත් බස් එකෙන් අත් අඩංගුවට ගත්තා ඔහුට ජාතික හැඳුනුම්පතක් නොතිබුනු නිසා. කොහොම වුනත් ඔහු පොලීසියෙදි නිදහස් කලා.

"පොලීසියෙදි ඔවුන් අපේ නම් රෙජිස්ටර් එකක සටහන් කරගෙන අපේ අත්සන් ගත්තා. අපි යාපනයේ ඉඳලා මෙහේ ආවේ ඇයි කියලා ඔවුන් ඇහුවා. මම පැහැදිලි කලා මම ආවේ එහේ රැකියා අවස්ථා නැති නිසා කියලා. මගේ මස්සිනා අවුරුදු 23ක් තිස්සෙ මෙහේ ඉඳලා තියෙනවා. ඔවුන් අපිව කූඩුවට දැම්මා.

"කූඩුව මීටර් 2.5ක් පලල මීටර් 3ක් දිග එකක්. අපිට ඒකෙ හිටගෙන ඉන්න විතරයි ඉඩ තිබුනෙ. කූඩුව ඇතුලෙ ඉන්න ගාන විටින් විට වෙනස් වුනා. එක රැක 14 දෙනෙක් හිටියා. ඔක්කොම ශාරීරික අවශ්‍යතාවලට තිබුනු වැසිකිලිය පුංචි කෑල්ලක්. ඒක කූඩුවෙන් වෙන් කරලා තිබ්බෙ කොට බිත්තියකින්. කවුරුහරි වැසිකිලිය ඇතුලෙ හිටගෙන ඉන්න කොට ඔහුගෙ ඇගේ ඉහල කොටස පිටතට පේනවා. මලමුත්‍ර ගඳ කූඩුව පුරාම පැතිරිලා. පොලීසිය අපට ගැහුවෙ නැහැ. ඒ අපේ පක්ෂය වහාම මැදිහත් වුනු නිසා

වෙන්න ඕන. රැඳවියන්ට දීපු බත් ගඳ ගහනවා සවුත්තුයි. අපි කැවෙ ගෙදරින් ගෙනාපු කෑම. මගේ බිරිඳත් එයාගෙ පවුලෙ අයත් දිනපතා ම අපිව බලන්න ආවා.

"බුද්ධි අංශයේ නිලධාරින් තුන් වතාවක් අපෙන් ප්‍රශ්න කලා. මම ඔවුන්ට කිව්වා මම සසප සාමාජිකයෙක් කියලා. දින හතකට පස්සෙ පොලීසිය අපව මහේස්ත්‍රාත් කුටියෙදි මහේස්ත්‍රාත්වරයකුට ඉදිරිපත් කලා. ඔවුන් අපව විවෘත උසාවියට ඉදිරිපත් කලේ නැහැ. පොලීසිය කිව්වා අපට විරුද්ධව කිසිම සාක්කියක් සොයා ගන්න බැරි වුන නිසා අපව නිදහස් කරන්න ඕන කියලා. ඒකෙන් අදහස් කෙරෙන්නෙ අපි දෙමල වීම අපව අත් අඩංගුවට ගන්න ප්‍රමානවත් හේතුවක් වුනා කියන එකයි."

ශ්‍රී ලංකාවේ හදිසි නීති නඩු විභාග නැතිව පුද්ගලයන් දිගු කාලයක් රඳවා ගැනීමට අවසර දෙයි. එහෙත් පොලීසිය රැඳවුම් නියෝගයක් ගෙන එය රැඳවියාට පැහැදිලි කොට එහි පිටපතක් ද ලබා දිය යුතු යැයි නීතියෙන් ඉල්ලා සිටී. "අපි රඳවා ගෙන හිටිය මුලු කාලය තුල ම කිසිම පොලිස් නිලධාරියෙක් අපිව අත් අඩංගුවට ගැනීම සම්බන්ධ රැඳවුම් නියෝගයක් අපිට පෙන්නුවෙ නැහැ." යයි කමල්දාසන් පැවසී ය. "අපිට ලියවිල්ලක් පෙන්නුවෙ දින හතකට පස්සෙ අපිව උසාවියට ගෙනිච්චට පස්සෙයි. පොලීසිය ඒ ලියවිල්ල අපිට වත් උසාවියට වත් පැහැදිලි කලේ නැහැ. ඒකෙ ඉහල "ආරක්ෂක අමාත්‍යංශය" කියන හෙඩිම තිබුනා. පොලීසිය අපට දිගට ම කිව්වෙ අපිව දීර්ඝ කාලයක් තියාගෙන ඉන්නෙ පක්ෂය අපි සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඇති කල හින්දයි කියලා. අපි ඒක විශ්වාස කලේ නැහැ."

කමල්දාසන්ගේ මස්සිනා ඉලන්චේලියන් එයට මෙසේ එකතු කලේ යඃ "ඔවුන් අපිව නිදහස් කරන්නෙ නැත්තෙ කමල්ගෙ දේශපාලන පක්ෂය මැදිහත් වුනු නිසා කියල පොලීසිය අපට කිව්වත් මම කවදාවත් ඔවුන් කියපු දෙය විශ්වාස කලේ නැහැ. මම කමල්ගෙන් පක්ෂය ගැන දැන ගෙන තියෙනවා. මම විශ්වාස කලා පක්ෂය අපිව නිදහස් කර ගන්න වැඩ කරනවා කියලා. ගොඩක් මිනිස්සු අපි වගේ අමාරුවෙ වැටිච්චි අයගෙන් ආරක්ෂක මුදල් කියලා සල්ලි කඩා ගන්න උත්සාහ කරනවා. කොහොම වුනත් සසප එහෙම කලේ නැහැ. ඔවුන් ප්‍රතිපත්ති වෙනුවෙන් සටන් කරනවා කියන එක මට තේරෙනවා."

කමල්දාසන් තව දුරටත් මෙසේ පැවසී යඃ "අපිත් එක්ක අත් අඩංගුවට ගත්ත අනෙක් තරුනයො දෙන්නත් නිදහස් කලා. මම හිතන්නෙ ඒ සසප අපිව නිදහස් කර ගන්න මැදිහත් වුන නිසා කියලා. අත් අඩංගුවට ගත්ත මොහොතෙ පටන් ම මට විශ්වාසය තිබුනා සසප අපගේ නිදහස වෙනුවෙන් සටන් කරනවා කියලා. පොලීසියෙ සහ මිලිටරියෙ මර්දනයට විරුද්ධව වගේ ම එල්ටීටීඊයෙ මර්දනයටත් විරුද්ධව අපේ සහෝදරවරු සහ අනෙක් අය ආරක්ෂා කර ගන්න පක්ෂය සටන් කරපු ආකාරය ගැන අතීත අත්දැකීම් මට තිබුනා. අපි දැනගෙන හිටියා අපගේ නිදහස වෙනුවෙන් ජාත්‍යන්තර උද්ඝෝෂනයක් ගෙන යන බව, පක්ෂය කම්කරු පන්තිය වෙත අපව නිදහස් කර ගැනීමේ අරගලය ගෙන යන බව.

"කම්කරු පන්තිය තමයි නවීන සමාජය තුල සිටින එකම විප්ලවවාදී පන්තිය. නිවැරදි මග පෙන්වීම ලබා දුන්නොත් කම්කරු පන්තියට අපිව නිදහස් කර ගැනීමේ බලය තියෙනවා. මෙය කරන්න පුලුවන් වෙන්නෙ සිංහල වේවා දෙමල වේවා වෙන ජාතියක් වේවා සියලු ම ජනවාර්ගික, වාර්ගික හා ජාතික භේදයන්ට එරෙහිව කම්කරු පන්තියේ ජාත්‍යන්තර එකමුතුව සඳහා සටන් කිරීම මගින් ම විතරයි.

"ලෙනින් ඔක්තෝබර් විප්ලවයට නායකත්වය දුන්නෙ ජාත්‍යන්තරවාදය මත පදනම් වෙලා. ස්ටැලින් ජාතිකවාදයට හැරුනා. විප්ලවයේ ජයග්‍රහනවලට වල කැපෙන්නත් අවසානයේ සෝවියට් සංගමයේ ම බිඳ විසිරීමටත් ඒක තුඩු දුන්නා. ස්ටැලින් යටතේ තුන් වන ජාත්‍යන්තරයේ පාවාදීමට විරුද්ධව විප්ලවවාදී ජාත්‍යන්තරවාදී උරුමය රැක ගැනීමේ අරගලයට ට්‍රොට්ස්කි උර දුන්නා. අද අපේ පක්ෂය එම අරගලය ජාත්‍යන්තරව ගෙන යනවා."

## යුද්ධය යටතේ ගෙවූ ජීවිතයක්

තමා සසපට බැඳීමට තීන්දු කලේ 1998 දී එල්ටීටීඊය විසින් වන්නියේ දී පක්ෂ සාමාජිකයන් සිවු දෙනෙකු අත් අඩංගුවට ගැනීමට එරෙහිව එය ගෙන ගිය අරගලයේ අත්දැකීමෙන් පසුව බව කමල්දාසන් පැවසී ය. අවසානයේ දී සසප ජාත්‍යන්තර උද්ඝෝෂනය ඔවුන් නිදහස් කිරීමට එල්ටීටීඊයට බල කලේ ය. ඔහු එවක දී සිටියේ වන්නියේ ය. "මම ඉපදුනේ 1978 අගෝස්තු මාසෙ. මගේ සම්පූර්න ජීවිතයම ගෙවිල තියෙන්නෙ යුද්ධයේ කොන්දේසි යටතෙ. (දැන් කමල්දාසන් සමග මීගමුවේ ජීවත් වන) මගේ තාත්තා වැඩ කලේ ත්‍රිකුනාමලයේ වරාය කොමිෂමේ."

මේ අවස්ථාවේ දී, කමල්දාසන්ගේ පියා ද සාකච්ඡාවට එක් වියඃ "ඔව්. මම කොලඹ, ගාල්ලෙ හා ත්‍රිකුනාමලයෙ වැඩ කරලා තියෙනවා. මම ලංකාවෙ ඔක්කොම ප්‍රධාන වරායවල වැඩ කරලා තියෙනවා. මම ලංකා සමසමාජ පක්ෂයේ වරාය සමිතියේ සාමාජිකයෙක්. අපි ප්‍රජාතන්ත්‍ර අයිතිවාසිකම් ජීවන තත්වයන් ආරක්ෂා කර ගන්න වැදගත් කම්කරු අරගල බොහොමයක් කලා. ඒ කාලෙ සමසමාජ පක්ෂය සිංහල හා දෙමල භාෂාවලට සම තත්වය දීම වෙනුවෙන් පෙනී හිටියා. ඒත් සමසමාජ නායක එන්.එම්. පෙරේරා සිරිමාවෝ බන්ඩාරනායක ආන්ඩුවේ මුදල් ඇමති වුනහ ම 1964දි ඔවුන් ඒක අත ඇරියා."

කමල්දාසන් තව දුරටත් මෙසේ පැවසී යඃ “1983 ජුලි මාසයෙදි දෙමල විරෝධී ජනඝාතන පිපුරුනහම, අපේ පවුල ත්‍රිකුනාමලය අත ඇරලා යාපනයේ කරෙයිනගර් බලා පිටත් වුනා. ඒත් මග කරදර නිසා අපි ආපහු කිලිනොච්චියට හැරුනා. ටික කාලෙකට පස්සෙ අපි කරෙයිනගර් ගියා. මගේ තාත්තා රස්සාවෙන් විශ්‍රාම යනකං දිගටම ත්‍රිකුනාමලයේ හිටියා. කරෙයිනගර්වල ජීවත් වෙන්න විධියක් සොයා ගන්නා බැරිකම නිසා අපි ආපහු කිලිනොච්චියට ආවා. එහෙත් අපට දිග කාලයක් ඉන්න බැරි වුන නිසා අපි (යාපනයේ ම) වඩුකොඩෙයිවලට ගියා. ඉන්දියානු හමුදාව ඒ ප්‍රදේශය අල්ලා ගත්තහ ම 1987දි අපි ආපහු කරෙයිනගර්වලට ගියා.

“ඇත්ත වසයෙන් ම, අපි නිතර ම තැනින් තැනට මාරු උනා -- වඩුකොඩෙයි, කිලිනොච්චි, පූනරින් -- ඒක නිසා අපිට හරිහමං නිවාස, පාසල් හෝ හොඳ රැකියා අවස්ථා ලැබුනෙ නැහැ. පිපිරෙන ෂෙල් වෙඩි, තුවක්කුවල සද්ද, පහලින් පියාසර කරන යුද ගුවන් යානාවලින් දාන ජරා බෝම්බ පිපිරෙන සද්ද අපේ පොඩි කාලෙ පසුබිම් සංගීතයේ කොටසක් වුනා. මම දන්න මට නෑයො වුනු බොහෝ දෙනෙක් මැරුම් කෑව නැතිනම් අංගවිකල උනා. බොහෝ දෙනෙක් බෝට්ටුවලින් ඉන්දියාවට පැනලා ගියා. සමහරු යුරෝපයට නැතිනම් වෙන රටවලට ගියා.

“මට කීප වාරයක් ම ඉස්කෝල මාරු කරන්න සිද්ධ උනා. මම කරෙයිනගර්වල මරියඥාන සම්බන්ධර් මහා විද්‍යාලය, ත්‍රිකුනාමලයේ කෝනලිංගම් මහා විද්‍යාලය, වඩුකොඩෙයි මූලෙයිවල සයිව ප්‍රකාශ විද්‍යාලය, පිලවට්ටෙයිවල ඇමරිකානු මීෂමේ දෙමල මිශ්‍ර විදුහල, වඩුකොඩෙයිවල තිරුනාවකරසු මහා විද්‍යාලය, කිලිනොච්චි මහා විද්‍යාලය ඇතුලු ඉස්කෝල හතකට ගියා. ඒත් ඒ එක ඉස්කෝලයකින් වත් හොඳ අධ්‍යාපනයක් ලැබුනෙ නැහැ. හැම දෙයක් ම පවතින යුද්ධය නිසා විනාශ වුනා.

“මම යාපනයෙන් ආවෙ එහේ ජීවත් වෙන්න විධියක් නැති නිසා. රස්සාවල් සොයා ගන්න හරි අමාරුයි. කොලඹට හා දකුනු පලාතට සාපේක්ෂව බඩු මිල අන්තෙට ම වැඩියි. දිනපතා අවශ්‍ය දේවල් ගන්න ප්‍රමානවත් ආදායමක් සොයා ගන්න වත් බැහැ. යාපනයේ මිලිටරිය පනවලා තියෙන සීමාවන් නිසා ධීවර රැකියාවෙ යෙදෙන්නත් අවස්ථාවක් නැහැ. උතුරු පලාතේ මිලිටරි පාලනය හරිම දරුනුයි. පැහැර ගැනීම් හා ඝාතන දිනපතා සිදු වෙනවා.”

සසප සාමාජික නඩරාජා විමලේස්වරන් සහ ඔහුගේ මිතුරු සිවනාදන් මදිවදනන් පසුගිය වසරේ මාර්තුවේ දී උතුරේ යාපන අර්ධද්වීපයට නුදුරු පුංගුඩුතිව් හා කයිට්ස් දූපත් යා කරන මුහුදු පාලම දිගේ යතුරු පැදියකින් යමින් සිටිය දී අතුරුදහන්ව ඇති බව කමල්දාසන් පැහැදිලි කලේ ය. “මිලිටරියට පුලුවන් ඕනැම කෙනෙක් ‘අතුරුදහන්’ කරලා බේරිලා ඉන්න. ඒකයි යාපනයේ ජනතාව භුක්ති විඳින ‘නිදහසේ’ තරම” යයි කමල්දාසන් පැවසී ය.

“2005දි මගේ පවුල තීරනය කලා මට කොලඹට ඇවිල්ලා මැද පෙරදිග රස්සාවකට යන්න උදව් කරන්න. මම යාපනයෙන් ඇවිල්ල දැන් අවුරුදු දෙකකුත් මාස නවයක් වෙනවා. යාපනේ ඉන්න මගේ නෑයන්ට කතා කරන එක හරිම අමාරුයි. ඒගොල්ලන්ට මොබයිල් පෝන් තිබ්බට හැම තිස්සෙ ම කවරේජ් නැහැ. එහේ තියෙන අමාරු තත්වය නිසා මම එහේ එන එකට ඒගොල්ල කැමති නැහැ. යාපනයේ බඩු මිල මෙහේ වගේ දෙතුන් ගුනයක් වෙනවා. ඒක නිසා මැද පෙරදිග ඉඳලා ආවට පස්සෙ මම තීරනය කලා මෙහේ (මීගමුවේ) නතර වෙලා රස්සාවක් හොයා ගන්න.

“දකුනේ සහ කොලඹ අවට රස්සාවක් සොයා ගන්න එක හැමෝටම ප්‍රශ්නයක්. කොහොම වුනත් දෙමල අයට ඒක නිශ්චිතව ම වඩාත් ම අමාරුයි. රස්සාවකට ඉල්ලුම් කරන්න නම් ප්‍රදේශයේ ග්‍රාම සේවකගෙන් ලියුමක් ගන්න ඕන. පදිංචිය ඔප්පු කලත් ලියුම ගන්න ග්‍රාම සේවකට පගාවක් දෙන්න වෙනවා. මට බෝට්ටු හදන යාඩ් එකක රස්සාවක් ලැබුනා. ඒත් යාඩ් එකේ අයිතිකාරයට පොලීසිය කියලා තිබුනා මට දෙමල අයගෙ බෝට්ටුවල වැඩ කරන්න දෙන්න එපා කියලා. මට වැඩ කරන්න දුන්නෙ සිංහල අයට අයිති බෝට්ටුවල විතරයි. පොලීසිය පස්සෙ ප්‍රදේශයේ තිබ්බ බෝට් යාඩ් ඔක්කොම වහලා දැම්මා. සිංහල කම්කරුවො දුසිම් ගනනකටත් රස්සාවල් නැති වුනා. ඒකෙන් පෙනුනා මිලිටරි-පොලිස් පාලනය දෙමල කම්කරුවන්ට වගේ ම සිංහල කම්කරුවන්ටත් තර්ජනයක් වෙන්නෙ කොහොමද කියන එක.”

පෙර පැවති එක්සත් ජාතික පක්ෂයේ (එජාප) ආන්ඩුව යටතේ 2002 දී ආරම්භ කෙරුනු කොලඹ පාලනය සහ එල්ටීටීඊය අතර “සාම ක්‍රියාදාමය” බිඳ වැටීමත් යුද්ධය කරා ආපසු යාමත් දේශපාලන විකල්පයක් සොයනු පිනිස මහජනතාව යොමු කරන බව කමල්දාසන් පැහැදිලි කලේ ය. 2005 ජනාධිපතිවරන උද්ඝෝෂනය තුල දී සැලකිය යුතු ස්ථරයක් සසප දෙසට හැරීම ආරම්භ කලේ ය.

“මගේ තාත්තා සහ පවුලේ ඔක්කොම නන්ද වික්‍රමසිංහ සහෝදරයා ඇමතීමට නියමිතව තිබුනු 2005දි යාපනයේ පවත්වන්න ගිය සසප ජනාධිපතිවරන රැස්වීමට ආවා. වන්නිය ඇතුලු උතුරු පලාතේ සියලු ප්‍රදේශවලින් පිරිමි අය, කාන්තාවෝ, ලමයි, හැටක පමන පිරිසක් අමාරු කොන්දේසි යටතෙ රැස්වීමට ආවා. ශාලාවේ දොරේ අලවලා තිබ්බ එල්ටීටීඊ පෝස්ටරයකින් තර්ජනය කලා අපි රැස්වීම තිබ්බොත් අපට පහර දෙනවා කියලා. අපේ යාපනයේ සහෝදරයෙක් කෙටි කතාවක් කරාට පස්සෙ රැස්වීම නතර කරන්න අපිට සිද්ධ වුනා.

“ඒ“සාම ක්‍රියාදාමය” වැඩ කරන ජනතාව වෙනුවෙන් නෙවි. ඒක එල්ටීටීඊයත් කොලඹ ආන්ඩුවත් අතරෙ බලය බෙදා ගැනීමේ උත්සාහයක්. ඒ“සාම ක්‍රියාදාමය” සිංහල, දෙමල, මුස්ලිම් වැඩ කරන ජනතාවගේ අභිලාෂයන් සපුරන්න ගෙනාපු එකක් නෙවි. “ජාත්‍යන්තර ප්‍රජාව” ඒකට අනුග්‍රහය දැක්වුවෙ ඒක අන්තර්ජාතික සංගතවල ලාභය සඳහා වඩා හොඳ කොන්දේසි නිර්මානය කරාවි කියන බලාපොරොත්තුවෙන්. බොහෝ දෙනෙක් හිතුවා ඒ ක්‍රියාදාමය හරහා සාමය උදා වේවි කියලා.

“දෙමල කතා කරන ජනතාවගෙ ප්‍රජාතන්ත්‍ර අයිතිවාසිකම් ආරක්ෂා කරගන්නා ඒවා දිනා ගන්න එල්ටීටීඊයේ දේශපාලනය අසමත්. සසප හැම තිස්සෙම කිව්වෙ, දෙමල ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අයිතිවාසිකම් රැක ගන්න පුලුවන් වෙන්නෙ, මිලිටරි-පොලිස් පාලනය අවසන් කරලා කම්කරු-ගොවි ආන්ඩුවක් පිහිටුවල විතරයි කියලා. දෙමල හා සිංහල වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගන්න අපි සටන් කරන්න ඕන. මේක ශ්‍රී ලංකාවට සීමා වෙච්ච සටනක් නෙවි. ඒක ජයගන්න පුලුවන් වෙන්නෙ කම්කරු පන්තියේ ජාත්‍යන්තර එකමුතුව මගින් විතරයි. අපට සහයෝගය දක්වමින් *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* එව්ව ලියුම් මෙම ජාත්‍යන්තර එකමුතුව පෙන්වනවා.”

© www.wsws.org